07

# භාෂා බලාධිකාරය, ප්‍රභුත්වය හා සංස්කෘතික හිංසනය

එල්. ඒ. සුනිල් වික්‍රමසිංහ

**සාරසංක්ෂේපය** :- භාෂාව කාල්පනික නිර්මාණයකි. නූතනවාදී හා පශ්චාත් නූතනවාදී කතිකා තුළදී සංස්කෘතිය හා භාෂා අධ්‍යයනය සඳහා වැදගත්කමක් ලබාදෙයි. ලෝකය පිළිබඳ ඥාන වේදයිත ප්‍රදානය කිරීමේ මෙවලමක් වශයෙන් භාෂාව අර්ථ විග්‍රහ වන අතර එහි කාර්යාවලිය සන්නිවේදනය, කතිකා නිෂ්පාදනය වැනි ව්‍යුහ තළ සංරචනය වේ. එසේම ශ්‍රාවක, දේශක යන ද්වි අංශවල අස්තිත්වය මත එහි පරමාදර්ශී භාවය තීරණය වන බවද පෙනේ. භාෂාවෙහි පැවැත්ම හා ආරක්ෂා වනුයේ සමාජ, සංස්කෘතික වපසරිය තුළ එය භාවිත වන ආකාරයටය. සංස්කෘතිය හා සමාජය ඉදිරියට ගෙන යනු ලබන වාහකයා භාෂාව වන්නේද මෙම නිසයි. එනිසාම විවිධ සංස්කෘතීන් තුළ සමාන නොවන භාෂා භාවිත වන බවක්ද පෙනේ. මෙය පදනම් කරගෙන, 'එක් සංස්කෘතියක් අන්‍යය සංස්කෘතියකට වඩා යහපත් යැයි' සැලකීම නිසා සංස්කෘතික හිංසනයක් ඇති විය හැකිය. එනම්, භාෂාවෙහි පවතින වාගාලාප උපයුක්ත කරගෙන සංස්කෘතික හිංසනයක් ඇති කිරීමට ශ්‍රාවක, කථක ද්විත්ව අස්තිත්ව හේතු වන අවස්ථා හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම භාෂාව සංස්කෘතිකමය වශයෙන් ආධිපත්‍යයක් උසුලන විට එය සංස්කෘතික උත්කර්ෂණ යාන්ත්‍රණයක් බවට පත් වේ. භාෂානු සංස්කෘතියෙහි ඇති උත්කර්ෂණ යාන්ත්‍රණය නිසා සමාජයෙහි ප්‍රභු නිර්ප්‍රභු භාවයක්ද නිර්මාණය වෙයි. මෙම පොදු ලක්ෂණය පදනම් කරගෙන ස්ව සංස්කෘතියෙහි ඇති ධර්මතා පමණක් උතුම් කොට සැලකීම සංස්කෘතික අන්‍යයත්වය වෙත ඇති කරන අසාධාරණයකි. මෙය මනුෂ්‍ය අයිතිවාසිකම් හා නිදහස් බවට මෙන්ම සාධාරණ පුරවැසියන් සහිත සමාජ වටපිටාවක් නිර්මාණය වීමට අවශ්‍ය වතාවරණය සැලසීමට බාධාවක් සපයන්නකි. අප මෙම පර්යේෂණ ලිපිය මගින් අපේක්ෂා කරනුයේ තත් කාරණය පිළිබඳව සුළු කතිකාවක් ඇති කිරීමය.

ප්‍රමුඛ පද :- භාෂා බලාධිකාරය, සංස්කෘතික හිංසනය, සංස්කෘතික උත්කර්ෂණය, සංස්කෘතික අන්‍යයත්වය, ධුරාවලිය

**භාෂාව හා එහි කාර්යාවලිය**

ලේඛනය හා භාෂණය සඳහා උපයුක්ත, මිනිසා විසින් නිපදවන ලද සන්නිවේදන කාර්ය සඳහා උපේත සංඥා පයීත විශේෂය භාෂාව නම් වේ. එය නිශ්චිත සමාජ සන්දර්භයක් තුළ ක්‍රියාකාරී වන්නකි. ලේඛනයේදී සංකේතානුසාරීව දෘශ්‍යමය රූපාශ්‍රව (අක්ෂර) භාෂාන්තර සංජානනය සිදු කළද භාෂණයේදී එය හුදු ශබ්ද සංඥානු ආශ්‍රයෙන් ශ්‍රවණ ගෝචර රටාවක් තුළ වරනැගෙයි. එහෙත් භාෂණයේදී භාෂා කාර්ය අදෘශ්‍යමාන තත්ත්වයක නියෝජනයකි. එම නිසා භාෂාව යනු, ලේඛන කාර්ය සඳහා උපයුක්ත සංකේත මණ්ඩලයක් සේම, කතා ව්‍යවහාරය සඳහා උපයෝගී ශබ්ද ප්‍රපංචයක් ලෙස අර්ථ විග්‍රහ කිරීම යුක්තය. එහි මූලික කාර්ය සන්නිවේදනය වුවද අර්ථ සංජානනය, බාහිර ලෝක තත්ත්ව අවබෝධනය, විශ්ව සත්‍යයන් ප්‍රකාශ කිරීම, සමාජ සංස්කෘතික සංජානනය යනාදියද අර්ථාන්විත භාවයට ලක් වේ. මිනිසා භාෂාව උපස්තම්භක කර ගැනීමෙන් අවට ලෝක තත්ත්වය අර්ථ විස්තාරයට පත් කරගන්නා නිසා භාෂාව ලෝකය සමග ගනුදෙනු කිරීම සඳහා භාවිත කරගන්නා මෙවලමක් ලෙස අර්ථ දත යුතු. 'කතිකා' (සංකථන) විග්‍රහයෙහි මූලික පදනම වන්නේද මෙයයි. (Jorgenson and Phillips, 2002: 12)

**පරමාදර්ශී කථකයා හා ශ්‍රාවකයා : භාෂා ද්විත්ව අස්තිත්වය**

භාෂාව මිනිස් මූලික සම්මුතිගත රීතිමය නිර්මාණයකි. එහි පැවැත්ම සඳහා ආවශ්‍යයික වන්නා වූ ප්‍රධාන මූලධර්ම ද්වයක් හඳුනාගත හැකි වේ. ලේඛන සංකේත හෝ භාෂණ ශබ්ද හෝ උච්චාරණය කරන්නා කථකයා (දේශකයා) නම් වෙයි. සන්නිවේදනය, පණිවුඩ හුවමාරුව, අදහස් ප්‍රකාශනය, බාහිර දේවල් හඳුනා ගැනීම වැනි තත්ත්ව ශබ්ද උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය මගින් වායුගෝලයට මුදා හැරීම කථකයා විසින් සිදු කරනු ලබන්නකි. ඔහු විසින් මුදා හරිනු ලබන ශබ්ද මාලාව වායුගෝලය හරහා ගමන් කරන විට කිසියම් පුද්ගලයෙකු එය ශ්‍රවණය කරනු ලබන්නේ නම් ඔහු ශ්‍රාවකයා නම් වෙයි. ශ්‍රාවකයා උච්චාරණය කරනු ලබන වාගාලාපයෙහි අර්ථය ඔහු ග්‍රහණය කරගැනීමෙන් පසු භාෂාවට නිශ්චිත පැවැත්මක් (අර්ථයක්) ලැබේ. භාෂාව ද්විත්ව අස්තිත්වයකින් යුක්ත නිර්මාණයක් යැයි ප්‍රකාශ කළ හැක්කේ තත් කාරණාව නිසාය. (Beaugrande,1993:02-06)

**සංස්කෘතික හා සමාජ සංඥ සහ භාෂාව**

භාෂාවේ ව්‍යුහය හා එහි කාර්ය සාධනය පිළිබඳ නව විෂයික ඥනයක් සම්පාදනය කළ ෆර්ඩි නැන්ඩි සුසෙයියෝ භාෂාව හුදු මනඃකල්පිත නිර්මාණයකැ'යි ප්‍රකාශ කළේය. (Eagleton, 2003: 84-109) වාක්කෝෂමය කාර්යෙහි නියුක්ත භාෂාව පෙර නිෂ්පාදනය කළ වචනවලින් සංයුක්ත දෙයකි. එම වචනවලට සම්ප්‍රදය විසින් දයාද කරන ලද අර්ථ ඇතිමුත් ඒවා මනෝවිද්‍යාත්මකය. භාෂාමය සංඥව එක්සත් කරන්නේ දෙයක් හෝ නමක් නොව සංකල්පයක් සහ ශබ්ද රූපයකි. ශබ්ද රූපය සංවේදක ඉන්ද්‍රියන්ට සම්බන්ධය. එයද මනෝවිද්‍යාත්මකය.

**සංකල්ප තරුව ශබ්ද රූපය**

මෙම සංකල්පය හා ශබ්දය එකට එක්වීම නිසා නිෂ්පාදනය වන රූපය සංඥව නම් වෙයි. සංඥව සමස්තය බව මේ අනුව හැඟී යනු ඇත. මෙහි ශබ්ද රූපය සංඥකාරිකය වෙයි. (සූචකය) සංකල්පය සංඥකාරිතය නම් වේ. (සූචිතය) සූචිතය පවසන විට සංකල්පීය අර්ථය අපට අවබෝධ වේ. මෙම සූචකය හා සූචිතය අතර ස්වාභාවික සම්බන්ධතාවක් නැත. එය හිතුමතික, සම්මුතිගත නිර්මාණයකි. ශිෂ්ටාචාරීය මිනිස් අවශ්‍යතා සඳහා නිෂ්පාදනය වූ සංස්කෘතිය, ආගම, සභ්‍යත්වය, දේශපාලනය නත් ඈ ධුරාවලිද සම්මුතිගත නිෂ්පාදනයන්ය. ඒවාහි අර්ථ විචල්‍යතාව ද්විගුණාකර වනුයේ භාෂාව උපයුක්තයෙනි. භාෂාව සම්මුතියක ප්‍රකාශනයක් බැවින් එය උපයුක්තයෙන් මිනිසා වටා කේන්ද්‍රානුසාරී වන සංස්කෘතික හා සමජ හැඩතලද ස්වාභාවික නොවන බවද මේ අනුව වැටහේ. භාෂාව හා එම හැඩතල අතර ඇත්තේද රීතිගත වෙනස් කළ හැකි ප්‍රතිමානගත ද්විත්ව අස්තිත්ව සම්බන්ධයකි. (Raman Seldon and all ed, 2005, 68 - 75)

භාෂාව හිංසන අවියක් වශයෙන් පුද්ගල විඥනය ප්‍රසාරණය කිරීමේදී එය හසුරුවන ප්‍රධාන මූල ත්‍රය වශයෙන් එහි කාර්ය, සමාජ හා සංස්කෘතික සංඥ ව්‍යුහ හා උච්චාරණ ශ්‍රවණ කාරකත්වය නම් කළ හැකිය.

## භාෂාව හා ප්‍රචණ්ඩත්වය

උක්ත කාරණාවල පර්යන්ත ලක්ෂණාවබෝධය තුළින් භාෂා ප්‍රචණ්ඩත්වය (හිංසනය) ක්‍රියාකාරී වන්නේ නිශ්චිත සංඥාමය ව්‍යුහයකට අනුරූප කාර්යාවලියක සිට බව පෙනේ. ප්‍රචණ්ඩත්වය හෝ හිංසනය හෝ හුදෙක් භාෂා ක්ෂේත්‍රය තුළ පමණක් පවතින්නක්ද නොවේ. ස්ථානීය විචල්‍යතාව හා සන්දර්භය පදනම් කරගෙන බහු ආකාර රටා සමුදයක් වටා එය කේන්ද්‍රානුසාරී වෙයි. ස්වාභාවික විපත් නිසා හටගන්නා ප්‍රචණ්ඩත්වය මානව ප්‍රචණ්ඩකාරීත්වයට වඩා වෙසෙස්ය. එහෙත් මිනිසා සම්මුතිගතව නිර්මාණය කළ සංස්කෘතික, සමාජීය හා ආගමික සන්දර්භවලදී ක්‍රියාකාරී භාෂා ප්‍රචණ්ඩත්වය පුද්ගල මානසික හා භෞතික හිංසනයට දායක වන්නක් බව පෙනේ. මෙම සංකල්පය ප්‍රධාන කාරණා ද්වයක් තුළින් අර්ථ විග්‍රහයට කළ යුත්තකි. භාෂාව සම්මුතිගත, ස්වාභාවික නිෂ්පාදනයක් බව අපි දනිමු. එසේම සංස්කෘතිය හා සමාජයද හිතුමතික, මානව කේන්ද්‍ර ශිෂ්ටාචාරීය නිර්මාණයක් බවද ප්‍රත්‍යක්ෂය. සංස්කෘතියේ හෝ සමාජයේ හෝ ප්‍රධාන වාහකයා භාෂාව වේ. මෙම කාර්යයේදී භාෂාව හිංසනයක් ආකාරයෙන් ක්‍රියාත්මක **'වන්නේම'** සමාජ සංස්කෘතික ධුරාවලියක් නිෂ්පාදනය සඳහා මිස සෘද සමෝධානයකට නොවේ. කුලය, ජනවාර්ගිකත්වය, පන්තිය, ආගම, වාර්ගිකත්වය, ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය යනාදී තත්ත්ව නිර්ණායකවලදී භාෂාව හිංසනයක් වශයෙන් ක්‍රියාකාරී වන අවස්ථා හඳුනා ගත හැකිය. (Favell, 1999: 1 - 16 ) (Ricoeur: 32 - 41)

## භාෂා හිංසනය හා ආධිපත්‍යය

ඉතාලි ජාතික අන්තනියෝ ග්‍රම්ස්චි විසින් ඉදිරිපත් කරන ලද ආධිපත්‍ය (හෙජමනිය)(Dylan, 2011, 1-3) පිළිබඳ සංකල්පයට අනුව පුද්ගලයා භාෂා ආධිපත්‍ය උපයුක්ත කරගෙන ධුරාවලියක් නිර්මාණය කරයි. සංස්කෘතික, දේශපාලනික, වාර්ගික ආදී බහුවිධ ආධිපත්‍යයන්හිදී කේන්ද්‍රය ප්‍රභුවාදී පිරිසක් විසින් පාලනය කරනු ලබන්නේද මෙම පසුබිම තුළය. එසේම ආචාරධර්මීය භාවයන් තීරණය කිරීමේ අගයක් වශයෙන්ද අධිපතිවාදය තීරකයෙකු වෙයි. (Dylan, 2011,3-6) මෙම ආධිපත්‍ය ඉසිලීමේ න්‍යායද කරුණු කිහිපයක් යටතේ උත්කර්ෂණයට ලක් වේ.

**01. භාෂා පරිධි කේන්ද්‍ර න්‍යාය හා සංස්කෘතික ආධිපත්‍යය** (Zarycki, 2007, 122-124) :- භාෂා ආධිපත්‍ය පිළිබඳ මෙම සංකල්පය යුරෝ හෝ ඇමරිකානු කේන්ද්‍රවාදය නිසා නිෂ්පාදනය වූවකි. ලෝක භාෂා පරිධි කේන්ද්‍රය තුළ ඉංග්‍රීසි, ප්‍රංශ, ස්පාඤ්ඤ, ජර්මන්, ඉතාලි ආදී භාෂා කේන්ද්‍රයේ සරන විට දෙමළ, සිංහල, බුරුම ආදී භාෂා පරිධියට යොමු වේ. එම නිසා භාෂා සංස්කෘතිය තුළ 'සුදු මිථ්‍යාවේදී' ආධිපත්‍යයක් උසුලන බවක් පෙනේ. භාෂාව පිළිබඳ මෙම සංස්කෘතික හිංසනය යටත්විජිතවාදී හා පශ්චාත් යටත්විජිතවාදී න්‍යායන් සමග ඍජුවම සම්බන්ධ වන්නකි. එසේම භාෂාව පිළිබඳ කේන්ද්‍ර පරිධි න්‍යාය නිසා සමාජ, සංස්කෘතික ධුරාවලියක්ද නිර්මාණය වන බව කිව හැකිය.
යටත්විජිතකරණයේදී සිදු වූ සංස්කෘතික අධිරාජ්‍යවාදයට ප්‍රතිරෝධයක් වශයෙන් මතු වූ ප්‍රාචිනවාදයේදී (පෙරදිගවාදය) භාෂාව පදනම් කරගෙන සිදු වන හිංසනය පිළිබඳ ප්‍රශ්න කරයි. විශේෂයෙන් ආර්ථික, භූගෝලීය වශයෙන් සිදු කරන ලද බලපෑම් හේතුවෙන් පෙරදිග හා අප්‍රිකානු සංස්කෘතිය නව යටත්විජිතකරණයකට ලක්විණි. මෙහිදී සංස්කෘතික හා භාෂා කේන්ද්‍රය හෙබ වූ අධිරාජ්‍යවාදීන් භාෂා හිංසනය භාවිත කරගෙන අප්‍රිකානු හා ආසියානු ස්වදේශිකයන් ප්‍රචණ්ඩකාරී ලෙස මර්දනය කරන්නටද විය. චිනුවා අචෙබි, ජෝසප් කොන්රඩ්, වෝලේ සොයින්කා වැනි ලේඛකයන් යටත්විජිතවාදී සාහිත්‍යය මගින් සිදු කරන ලද අරගලය මෙයට මූලිකම විය.

යථෝක්ත කාරණයෙහි අභාසය පදනම් කරගෙන පෙරදිග සංස්කෘතික කලාප තුළද උපබෙදීම් වර්ධනය වීමක් ඇති විණි. ඉංග්‍රිසි භාෂා භාවිතය පිළිබඳ ආධිපත්‍යය ඉස්මතු වන්නේ තත් කාරණය පදනම් කරගෙනයි. 'අපේ පුතා විභාගේ පාස් *ඉංග්‍රිසිවලටත් ඒ එකක්*', 'භාපෝ *ගාල්ලේ* පොරක්. කතා කරන්නේ ඔහෙලයි කියලා', 'පොර *ජෆ්නා ටැමිල්.* ඒකයි ලස්සනට උච්චාරණය කරන්නේ'.

භාෂා ආධිපත්‍යය පිළිබඳ යටත්විජිතවාදී දෘෂ්ටිවාද නූතන සංස්කෘතික කලාප තුළද ක්‍රියාකාරී වන බව මේ අනුව විද්‍යමාන වේ.
**02. උච්චාරණ ප්‍රභේද හා ශබ්ද රටා පිළිබඳ ආකල්පය** :- භාෂාව ශ්‍රාවක, දේශක අර්ථ සංජානනය තුළින් විස්තාරය වන සංකල්පයක් වන විට විවිධ සංස්කෘතීන් තුළ විවිධාකාරයෙන් එය ප්‍රචලනය වනු පෙනේ. ප්‍රදේශීය විවිධතා, භූගෝලීය පසුබිම, උච්චාරණ ඉන්ද්‍රීය පද්ධතිය,

දේශගුණය, භාෂා පරිණාමය, සංස්කෘතික සංස්පර්ශය හා සෘණීකරණය ආදී දෑ එයට හේතු වේ. භාෂා ශාඛාවක ප්‍රශාඛා (උපභාෂා) නිර්මාණය වීම සඳහා බලපානු ලබන ප්‍රධාන කාරණයද මෙයයි. මෙම උපභාෂා භාවිතයේදී සංස්කෘතික ආධිපත්‍ය නිර්මාණය වීම නිසාද භාෂා හිංසනය ක්‍රියාකාරී වේ.

'*අපි උඩරට සිංහල කතා කරන අය*', '*වතු දෙමළ පහත් භාෂාවක්*', '*ශාස්ත්‍රීය සංවාදවලට පර භාෂාව අදාළ නෑ*', '*මොනවද ඔය කතාකරන්නේ. තුත්තුකුඩු භාෂාව*', '*කෙල්ල විභාගපේ පාස්. හැබැයි ඉංග්‍රිසි ෆේල්*' (ව්‍යවහාරය)

**03. සංස්කෘතික අන්‍යයත්වය හා ආත්මීයත්වය** (Kitayama and Markus, 1991: 224 – 226) :- භූගෝලීය කලාපවල විවිධත්වයට අනුව සංස්කෘතිය විවිධ විය හැකිය. මෙම විවිධතාව සමාජය තුළ විසරණය වීමේදී ද්විමය සංස්කෘතීන් නිර්මාණය වෙයි. කිසියම් භූගෝලීය ප්‍රදේශයක විස්තීර්ණ සංස්කෘතියක් ස්වීය අනන්‍යතාව හා වෙනස අවබෝධ කරගනුයේ සාපේක්ෂ වශයෙන් අන්‍ය සංස්කෘතියක වෙනස තුළිනි. මෙම වෙනස අවබෝධයේදී සිය සංස්කෘතියෙහි විද්‍යමාන පවතින 'සියල්ලම' හොඳ යැයි නිර්ණය කිරීම සඳහා නිෂ්පාදනය කරනු ලබන දෘෂ්ටිවාදය 'සංස්කෘතික ආත්මීයතාව' නම් වේ. මෙම සංකල්පය වර්ධනය වීම නිසා සංස්කෘතික ආධිපත්‍යයක් ඉසළීම මෙන්ම භාෂා හිංසනයද ක්‍රියාකාරී වේ. එය සාධාරණ නොවන මානයකදී 'අප සංස්කෘතික විවිධතාව පදනම් කරගෙන අන්‍ය සංස්කෘතිය දෙසද සාධාරණ පරිකල්පයක් යොමු කිරීම සංස්කෘතික අන්‍යයත්වය නම් වෙයි. සංස්කෘතික අන්‍යයත්වයට සාධාරණයක් ඉටු කිරීමට නම් භාෂා හිංසනය අවම කිරීම කළ යුතුය.

''සර් ඉන්නවාද?
''ඔව් හැබැයි **තල තෙලයෙක්**. එක නිසා කලින් පනිමු'' (ව්‍යවහාරය)
මෙය සංස්කෘතික ආත්මීයතාව පදනම් කරගෙන භාෂා හිංසනය ක්‍රියාකාරී වන අවස්ථාවකි. සංස්කෘතික සංජානනයේදී පූර්වයෙන් දෙන ලද අර්ථ අප විඥානය හැඩගස් වන බවක්ද පෙනේ. කාර්යාල නිලධුරාවලිය වැනි සමාජ ව්‍යුහයක ප්‍රභූත්වය ස්ව සංස්කෘතියෙහි පුද්ගලයෙකුට පමණක් ලැබිය යුතුය යන දෘෂ්ටිවාදය උත්කර්ෂණ යාන්ත්‍රණයට ඇඳන්නේ එනිසයි.

''හපෝ උදේ පාන්දර **ගණ ගෙඩියෙක්.** දවසම ඉවරයි'' (ව්‍යවහාරය) භාෂා ව්‍යවහාරය උපයුක්තයෙන් සංස්කෘතික ප්‍රතිමාන හිංසනයට ලක් වන බව මේ අනුව පෙනේ. සංස්කෘතිය භාෂාවෙහි තීරකයා වුවද භාෂාව සංස්කෘතියෙහි තීරකයාද විය හැකිය. සංස්කෘතියක විවිධත්ව හැසිරීම් දෘශ්‍යමාන වීම නොවැළැක්විය හැකිය. පුද්ගලයා සිය සංස්කෘතික සභ්‍යත්වයට අනුකූල වෙමින් එහි ධර්මතා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරයි. එහි සාවද්‍ය භාවයක් නොපෙනේ. එම ධර්මතා භාෂාවේ අපට දෘශ්‍ය දෘෂ්ටි ආශ්‍රයෙන් විස්තර කළ හැකිය. භාෂාව විශ්ව ප්‍රකාශනයක් වන්නේද එම කාරණය නිසයි. එහෙත් එය පදනම් කරගෙන සදාචාරාත්මක හා ආචාරවිද්‍යාත්මක හරයන් හිංසනයට ලක්කිරීම සාධාරණ නැත.

භාෂාව නිසි භාවිතය සඳහා රීති නිෂ්පදනය කරයි. එහෙත් ඒවා මිථ්‍යා නිෂ්පාදන මෙවලමක් වන අවස්ථාද ඇත. භික්ෂූන් වහන්සේලා දැකීම අශුභ බව භාෂාව තීරණය කරන්නේද එම කාරණය පදනම් කරගෙනයි. එම නිසාම භාෂා හිංසනයද මිථ්‍යාමය වේශයක් බව කල්පනය කළ හැකිය. එසේම හිංසනය තර්කබුද්ධිවාදයෙන් බිඳලිය හැකි තථ්‍ය එලෙසින්ම පුනර්රූපණය නොකරන්නකි. භාෂාව හා යථාර්ථය අතර ඇතතේද තථ්‍ය සම්බන්ධයක් නොවේ. නිදසුනක් ආශ්‍රයෙන් මෙය සනාථ කරමු. ලෝකයෙහි සිටින සියලු බල්ලෙකුගේම ශබ්ද කිරීම සාමාන වේ. එහෙත් එය ඉංග්‍රිසි භාෂාවෙහිදී 'වව් වව්' ලෙසද සිංහල භාෂාවෙහිදී 'බව් බව්' කියාද ලේඛනයට ගැනේ. (ලියනගේ, 2010, 16-19) ශබ්ද සාම්‍ය අර්ථ අසමානතාවකට පත් කරන බව මේ අනුව පෙනේ. එනිසාම සංස්කෘතික තථ්‍ය හා භාෂා නිරූපණය අතර ඇත්තේද අර්ථ විසදෘශ්‍යතාවක් බව වැටහෙනු ඇත. හේතුව එය භාවිත කරන පරමදර්ශී ශ්‍රාවක, දේශක දෙදෙනාම අයත් වන්නේ සංස්කෘතික හිතුමතික ව්‍යුහයකට වීමය.

සංස්කෘතික සභ්‍යත්වය තුළදී භාෂාව උපයුක්තයෙන් උත්කර්ෂණය හා උත්තර ධර්මතා නිරූපණය වන අවස්ථාද හඳුනා ගත හැකිය. සිය සංස්කෘතියෙහි විද්‍යාමන දේ පමණක් උත්තුංග යැයි සැලකීම උත්කර්ෂණය නම් වේ. එහෙත් සංස්කෘතික උත්කර්ෂණයෙන් මැනිය නොහැකි ධර්මතාද සංස්කෘතියක නිදන්ගතව ඇත. ආදරය, ස්නේහය, කරුණාව, උපේක්ෂාව නිදසුන් වෙයි.

එහෙත් භාෂාව 'හිතුමතික' සංස්කෘතික පාලනයක් වන විට එය හිංසනකාරී මර්දනයක් වන බව කිව හැකිය. භාෂාව සංස්කෘතික සංඥවක් සේම ද්විත්ව අස්තිත්ව ක්‍රියාකාරකයක් වන විට එය යථාර්ථය ව්‍යාඛ්‍යාන කරනුයේ නව ආකාරයකට වන බැවින් හිංසනයක් විය හැකි අවස්ථා බහුලය.

**සංස්කෘතික සංඥ හා ද්විත්ව අස්තිතිත්වය : යථාර්ථ ප්‍රයෝග (Favell, 1999: 1 - 04)**

භාෂාව, සංස්කෘතිය හා මිනිස් සභ්‍යත්වය පවා මිනිසා විසින්ම නිර්මාණය කරන ලද දෙයක් බව ව්‍යුහවාදී විචාර න්‍යාය නිසා අපි උගත්තෙමු. සංඥ, කාරිත හා කාරික සම්බන්ධතාව නිසා සංස්කෘතිය නිෂ්පාදනය වන අතරම සංස්කෘතියෙහි වාහකයා භාෂාව වන විට ශ්‍රාවක හා කථක ද්විත්ව අස්තිත්වය මගින් භාෂාවට නිශ්චිත අර්ථයක් ලැබේ. දෙවැන්න සංඥ, කාරිතය හා කාරකය යන සංකල්ප ද්වය ආශ්‍රයෙන් 'සංඥවක්' නිෂ්පාදනය වන බැවින් එහි ඇත්තේද ද්විත්ව අස්තිත්වයකි. (Eagleton, 2003: 84 - 85) භාෂාවට, සංස්කෘතියට නිසි අර්ථ ආරෝපණය වන්නේ එහි ඇති විරුද්ධාර්ථ පදවල අර්ථ සංකලය නිසා බව විසංයෝජනවාදයේදී අර්ථ කථනයට ලක්වූයේද තත් සන්දර්භානුකූලවය. (Ibid, 112 - 118) කලු යන සංඥවෙහි අර්ථ සාධනයට සුදු යන විරුද්ධාර්ථයෙහි පැවැත්ම තිබිය යුතුය. 'සිංහල' යන පදයෙහි අර්ථ සාධනයට එහි විරුද්ධ 'මුස්ලිම් හෝ දමිළ' යන පදවල අර්ථ සාධනය ආවශ්‍යයික වේ. එනිසාම භාෂාව මෙන්ම සංස්කෘතියද නිෂ්පන්නව ඇත්තේ ද්විත්ව අස්තිත්ව මගින් පැහැදිලිය.

ශ්‍රාවක හා කථක අස්තිත්වය නිසා සිදු වන මූලික කාර්ය නම් භාෂාවට නිසි අර්ථයක් ලැබීමයි. භාෂා හිංසනය නිසි ආකාරව ක්‍රියාකාරී වීමට නම් ශ්‍රාවක කථක ද්විත්ව අස්තිත්වයද ශක්තිමත් විය යුතුය. ශ්‍රාවකයාගේ සේම කථකයාගේද පරිකල්පන විඥනය විසම වන බැවින් සන්නිවේදනය, අර්ථ සංජානනය ආදිය වෙසෙස් විය හැකිය. ශාස්ත්‍රාලයීය කතිකා සමූහයක භාෂා භාවිතය මරණාධාර සමිති කතිකා සමූහයකට වඩා වෙනස් වන්නේද එබැවිනි. දෙවැන්න උච්චාරණ විධි, ස්වයං පාලනය, භාෂා සංරක්ෂණය හා සංස්කරණය ආදියද කථක හා ශ්‍රාවක සංකල්පවලට අනුව වෙනස් විය හැකිය.

'කාන්තාවන්ගේ දැනුම හැඳි මිටේය', 'ඇස් නොපෙනෙන අය මන්ද බුද්ධිකයෝය', 'සියලුම ශ්‍රී ලාංකිකයෝ සිංහලයෝය' වැනි ප්‍රකාශවල උච්චාරණ ධ්වනිය, කථක ශ්‍රාවක පරිකල්පනය වැනි කාරණා මත හිංසනයක්ද නොවේද යන්න තීරණය වේ. උක්ත ප්‍රකාශවල ප්‍රතිවිරුද්ධ දිශානතිය කෙරෙහි පමණක් අවධානය යොමු කරන විට එය භාෂා හිංසනයක් බව අවබෝධ වනු ඇත. දෙවැන්න ශ්‍රාවක කථක අස්තිත්වයෙහි පැවැත්මට ඉන්ද්‍රිය සංජානනයෙහි නිරෝගී භාවයද අත්‍යවශ්‍ය වන්නකි. උච්චාරණ ධ්වනි පැහැදිලිව අර්ථ අවබෝධනයට ශ්‍රවණය නිසි ආකාරයෙන් සිදු වීමද, මොළයේ අස්ථි ක්‍රියාකාරීත්වය නිසි ආකාරයෙන්ද තිබිය යුතුය. අර්ථ සංජානනය නිසි අයුරින් සිදු වන්නේ එවිටය භාෂාව යථාර්ථය නිෂ්පාදනය කරනුයේ උක්ත ද්විත්ව අස්තිත්වයේ ක්‍රියාකාරීත්වය මතය. එමගින් දිශානුගත පූර්ණ ප්‍රකාශන ඇති වෙයි. 'මම පන්සල් යනවා' යැයි කියූ විට ධ්වනිත අර්ථය කිසියම් අර්ථයකට දිශානතිය පෙන්වන්නකි. ශ්‍රාවකයා එහි අර්ථයෙන් දේශකයාගේ ස්වයං කැමැත්ත හා මනස් ප්‍රකාශය අවබෝධ කරගනී. සංස්කෘතික භාෂා භාවිතය හා හිංසනයද කිසියම් දිශානුගත අර්ථයක් ජනනය කරයි. 'මුස්ලිම් ගොබ්බයෝව සිංහල අපි මරනවා' සංස්කෘතික දෘෂ්ටිවාදවල දිශානතිය පෙන්නුම් කරන්නක් වශයෙන් මෙය දැක්විය හැකිය. එම නිසා භාෂාව සංස්කෘතික හිංසනයක් ලෙස ක්‍රියාකාරී වීමේදී එහි ද්විත්ව අස්තිත්වය මත ඇති වන දිශානුගත පූර්ණ ප්‍රකාශවල වලංගු භාවය පරීක්ෂා කිරීම සුදුසුය.

දෙවැන්න සංඥ කාරිත හා කාරක ද්විත්ව අස්තිත්වය සඳහන් කළ හැකිය. සංස්කෘතිය මෙන්ම එහි ප්‍රභූත්වය පෙන්නුම් කරන සංඥ ආකස්මික බව අපට අවබෝධ වනුයේද එනිසයි. ශිෂ්ටාචාර මානවයාගේ අවශ්‍යතා මත කෘෂිකාර්මික සමාජයේ තුළ ඇති වූ විවාහ හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් මත සංස්කෘතිය නිර්මිත විණි. මෙසේ නිර්මිත වූ සංස්කෘතියෙහි සභ්‍යත්වය ආරක්ෂා කරන හර පද්ධතීන් හා සම්ප්‍රදායන් සියල්ලම සම්මුතිගත රීතිමය කාරණා මත ඇති වූවකි. එනිසා සංස්කෘතිය හා එහි නියාම ධර්ම වන සභ්‍යත්වය තුළ ඇත්තේද ආකස්මික රීතිමය සම්බන්ධතාවකි. ඒවා රීති වන බැවින් අවශ්‍ය පරිසරයකදී වෙනස් කළ හැකිය. සංස්කෘතිය සාම්ප්‍රදායික නිර්මාණයක් වන බැවින් සාමූහික භාෂා පද්ධතිය ඓතිහාසික නිර්මාණයක්ද වෙයි. එනිසාම යථාර්ථයද ඓතිහාසික භාෂා නිෂ්පාදනයක් යැයි කීම සාවද්‍ය නොවනු ඇත.

'මාව මරාගෙන කාපන්', 'කෝ අර කාලකණ්ණි නාකි උන්දෑ?' වැනි හිංසනාත්මක ප්‍රකාශයක පළමුවැන්න දිශානුගත පූර්ණ අර්ථයක් ජනනය කළද දෙවැන්න ඉතිහාසගත සාමූහික තීරණයක් විද්‍යාමාන කරයි. මහල්ලන් කාලකණ්ණි පිරිසක් සේ දෘෂ්ටිවාදගත වීම ඓතිහාසික නිර්මාණයක් විය හැකිය. එනිසා සංස්කෘතික ප්‍රභුත්වයද ඓතිහාසික නිර්මාණයක් බව කීම නිවැරදි වේ.

භාෂාව සංස්කෘතික පෞරුෂය හා ආධිපත්‍ය විද්‍යමාන කරන තීරකයක්ද වෙයි. සංස්කෘතිය විසින් දයාද කරන ලද වස්ත්‍රාභරණ, දින චර්යා හා රීති අනුගමනය නොකරන පුද්ගලයා අසභ්‍යවාදියෙකු වශයෙන් සැලකෙනේ එබැවිනි. විහාරස්ථානයට, කෝවිලට, මළ ගෙදරට, මංගල උත්සවයට පිටත් වන අප එයට අදාළ වස්ත්‍රවලින් සැරසී යන්නේද එනිසයි. මෙම සංස්කෘතික සංඥා හා පෞරුෂය අතර ඇත්තේද සමාන නොවන යථාර්ථයකි. ෆ්‍රොයිඩියානු මනෝ විග්‍රහයට අනුව පෞරුෂය තීරණය කරන සාධකය මනසය. දෙවැන්න සංස්කෘතික කතිකාව තුළ අනුගමනය කළ යුතු චාරිත්‍ර පුද්ගලයා සිදු කරනවා විනා සැබවින්ම රුචිකත්වයක් දක්වනවාද යන්නද ගැටලු උපදවන්නකි. එම නිසා මෙවැනි සන්දර්භ පසුබිම්ව ශ්‍රවණය වන භාෂා ප්‍රකාශනද යථාර්ථවාදීද යන්න ප්‍රශ්න කළ යුතුය.

'පන්සල් යන්න සුදු ඇඳුමක්ම ඕනේද?', 'දෙය්යන්ගෙ ලෙඩ හැදුනම මස් කන්න හොඳ නැද්ද', 'ගැහැණු ළමයි වැඩිය බිත්තර කන්න හොඳ නෑ' වැනි ප්‍රකාශනවල ශ්ලේෂාර්ථය හිංසනයක් බව වැටහුනද ඒවා ඓතිහාසික නිර්මාණ බැවින් යථාර්ථවාදීද යන පැනය එයින්ම ඇසිය යුතු වේ. දෙවැන්න භාෂා සංඥා නිරන්තරයෙන්ම ප්‍රතිවිරුද්ධ අදහස් දරන බැවින් කථක, දේශක අනතර් සන්නිවේදනය රඳා පවතින්නේද එම කාරණය පසුබිම් කරගෙන බව පෙනේ.

අම්මා ගෙදර යමු' (කථකයා), 'ඇයි ගෙදර විතරද යන්න තියෙන්නේ?' (දේශකයා) මෙවැනි සන්දර්භවලදී භාෂාව යථාර්ථය පරාවර්තනය කරයි. කථකයා තථ්‍ය පිළිබඳ දරන අදහස දේශකයා විසින් වෙනත් දිශානුගත පූර්ණයකට පත් කරනු ලබයි. එම නිසා භාෂා අධිපත්‍ය සංස්කෘතික යථාර්ථය සංජානනය කරනුයේ කථක දේශක ප්‍රශ්නෝත්තර මත බව විද්‍යමානය.

සංස්කෘතික ක්ෂේත්‍රයන්හිදී භාෂාව 'විශ්වාස' සමූහයක් ලෙස ක්‍රියාකාරී වන විට එය දෘෂ්ටිවාද පද්ධතියක් ලෙසද පුරවැසියා පාලනයට ලක් කරයි. ජර්මන් දර්ශනවාදයේ සිට කාල්මාක්ස්, ෆෙඩ්රික් එංගල්ස් වැනි දර්ශනිකයන්ගේ විග්‍රහයන් තුළදී පවා 'මතවාදය' යන පදය සංස්කෘතික බලය බෙදීම් සංකල්පයක් ලෙස විග්‍රහ වී ඇත. විශේෂයෙන් පාලකයා, පාලනය හා පාලනයට ලක්වන්නා තුළ ධුරාවලියක් නිෂ්පාදනය කරන විශ්වාස සම්මුතීන් දෘෂ්ටිවාද බව එහි මූලික සංකල්ප බවට පත් විය. දෘෂ්ටිවාදයෙහි කාර්ය වනුයේ නිෂ්පාදන මාධ්‍යයන්ගේ නිරන්තර ප්‍රතිනිෂ්පාදන මෙවලම් බවද අර්ථකථනය විය. විශේෂයෙන් බල ව්‍යුහීයකරණය හා නිෂ්පාදනය තුළ රාජ්‍ය ආඥාදායකත්වය පොදු ජන විඥානය හසුරු වන, සත්‍ය යැයි පසක් කළ නොහැකි විශ්වාස සමූහ මේ යටතට අයත් වේ. මෙම විඥානයෙහි හැඩය වෙනස් කිරීම විප්ලවයට දායකත්වයක් සපයන්නක් බවද මාක්ස් සහ එංගල්ස් අවධාරණය කරන්නට විණි.

එම නිසා දෘෂ්ටිවාද නිෂ්පාදන ක්ෂේත්‍රයෙහිදී සංස්කෘතික ආධිපත්‍ය - මය තත්ත්වවලදී භාෂාව නව නිෂ්පාදනයක් බවද පෙනේ. පෙර සඳ නිම නොකරන ලද සම්මුතීන්වලට පරිබාහිර නව අධිපතිවාදී භාෂා ව්‍යවහාර භාවිතයටත්, ඒවාට විකල්පමය අර්ථ සංඥා යෝජනා කිරීමටත් භාෂා දෘෂ්ටිවාදයට කළ හැක්කකි. මෙහිදී භාෂාවේ පවතින මූලික වචනවල ස්ථාවරත්වය ස්වල්ප වශයෙන් වෙනස් කොට එය ආධිපත්‍යය උසුලන ව්‍යවහාරයක් බවට සංක්‍රාන්ති කිරීමේ හැකියාවක් ඒවා හසුරුවන්නන්ට කළ හැකි වෙයි. භාෂාවේ විශේෂ්‍ය විශේෂණ ප්‍රයෝග, අව්‍ය පද යනාදිය උපයුක්ත වන්නේද තත් සන්දර්භවලදීය.

'මහාරාණී **හොඳ කෙල්ල' 'කෝවිලට යන නිසා** මහාරාණී හොඳ කෙල්ල' 'කෝවිල' යන සංස්කෘතික පදය මහාරාණී සංස්කෘතික ශිෂ්ටත්වයක් ඇති තැනැත්තියක් බව අපට අවබෝධ කරවයි. එහෙත් කෝවිල් නොයන යහපත් මහාරාණීලා සිටිය නොහැකිද යන ප්‍රාශ්නිකය ඇසීමෙන් භාෂාව සංස්කෘතික ආධිපත්‍යයක් උසුලන බව වැටහෙයි. භාෂාව තුළින් යථාර්ථමය සංඥා හසුරුවන්නේ විශේෂ උක්ති භාවිතයෙන් බවද මේ අනුව පෙනේ. එනම්, මූලික වචන සංස්කරණය වීමෙන් නිෂ්පන්න වන සංස්කෘතික වචන භාෂා ආධිපත්‍යයක් උසුලන බව පෙනේ. බොහෝ විට ආධිපත්‍ය උසුලන වචන දේශපාලනික,

සංස්කෘතික ක්ෂේත්‍රයන්හිදී හැඩ ගැසෙන අතර වචන මගින් දෘෂ්ටිවාද නිෂ්පාදනයෙහි ආරම්භය ඇති වන්නේද මෙ හා සමගය.

භාෂාව ද්විත්ව අස්තිත්වයක් වන බැවින් එයින් මිදීමද කළ නොහැක්කකි. සන්නිවේදනය භාෂාවෙහි මූලිකම කාරණය වෙයි. එහෙත් එම සන්නිවේදනයේදී භාෂාව හිංසනයක් හා උත්තර ප්‍රභූවාදයක් නිර්මාණය කරන්නේ නම් එය සාධාරණ නැත. භාෂා සංස්කෘතික අධ්‍යයනය යනු, මෙම සාධාරණ මාන සමාජ සංස්ථාව තුළ ක්‍රියාකාරී වන ආකාරය අධ්‍යයනය කිරීමය. එම අධ්‍යයනයන් මනා ලෙස සිදු කොට භාෂා හිංසනයක් සිදු වන අවස්ථා හඳුනා ගැනීමත්, එම හිංසන සංස්කරණය කිරීමත් සාධාරණ මිනිස් අවශ්‍යතා රෝපණය කළ හැකි අවස්ථා උදා කිරීම හේතු අර්ථ වන බව කීම වඩා සුදුසුය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරකීර්ති, ලියනගේ. (2010). *පහන සහ කැඩපත*, පුංචි බොරැල්ල, විජේසූරිය පාඨක කේන්ද්‍රය.

Beaugrande, Robert de.(1993).*Discourse Analysis and Literary Theory: Closing the Gap.*
[PDF]Availableat:http://jaconlinejournal.com/archives/vol13.2/debeaugrande-robert.pdf. [Accessed 10 December 2014]

Dylan J. Riley. (2011). *Hegemony, Democracy, and Passive Revolution in Gramsci'sPrison Notebooks,* [PDF] Available at:
http://escholarship.org/uc/item/5x48f0mz,[Accessed 10 December 2014]

Eagleton, Terry.(2003). *Literary Theory: An Introduction.*Minneapolis: The University of Minnesota Press.

Jorgensen, M. and Phillips, L. (2002). *Discourse Analysis as Theory and Method*. London: Sage Publications.

M Favell, Andrew.(1999). Violence*, Language, And Fascim: Reproductions of Discursive Identities*. [PDF] Available at: *www.pins.org.za/pins25/pins25_article05_Favell.pdf,* [Accessed 10 December 2014]

Markus, **Hazel Rose and** Kitayama, Shinobu. *Culture and the Self: Implications for Cognition, Emotion, and Motivation Culture and the Self:*[PDF] Available at:

http://www2.psych.ubc.ca/~ara/Teaching 407/psych407 readings/Markus, [Accessed 11 December 2014]

Ricoeur, P. (Year not referred) *Violence and Language*. [PDF] Available at: *jffp.org/ojs/index.php/jffp/article/download/410/404*, [Accessed 12 December 2014]

Selden, R., Widdowson, P. and Brooker, P.(2005). *A Reader's Guide to Contemporary Literary Theory*. (Fifth ed.), Edinburgh: Pearson education limited.

Zarycki, Tomasz.(2007).*An Interdisciplinary Model of Centre - Periphery Relations: A Theoretical Proposition*,[PDF] Available at:*www.iss.uw.edu.pl/zarycki/pdf/**interdisciplinary**.pdf,* [Accessed 13 December 2014]